දුරකථන/தொலைபேசி இல./Telephone Nos.
අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617
ලේකම් / செயலாளர் / Secretary: 2784812
කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846
ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය',
බත්තරමුල්ල
'இசுருபாயா' ஸ்ரீ ஜயவர்த்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya",
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. ..................................

මගේ අංකය / எனது இல / My No. : ඊඩී 1/15/2/2/100

දිනය / திகதி / Date : 2007.02. 05 දින.

චක්‍රලේඛ අංක : 2006/46

සියළුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියළුම ජාතික පාසල් විදුහල්පතිවරුන් වෙත.

**<u>විදේශ ක්‍රීඩා තරගාවලි සහ ක්‍රීඩා පුහුණුවීම් සඳහා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්, විදුහල්පතිවරුන් සහ ගුරු භවතුන් සහභාගි වීම.</u>**

උක්ත සංචාර සංවිධානය කිරීමේ දී අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති 2004/29 චක්‍රලේඛයට අමතරව මෙම චක්‍රලේඛය ද ක්‍රියාත්මක වේ.

02. තවද විදේශ සංචාර සඳහා ආරාධනයක් ලැබුණු වහාම එය අධ්‍යාපන අමාත්‍යාංශයේ ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා විෂයය භාර අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර සංචාරය සංවිධානය කිරීම සඳහා අවසරයක් ලබා ගත යුතුය. එසේ පූර්ව අනුමැතියක් ලබා නොගෙන සංවිධානය කරනු ලබන කිසිම සංචාරයකට අනුමැතිය ලබා නොදෙන බව වැඩිදුරටත් දන්වමි.

03. මින් ඉදිරියට විදේශ සංචාර සඳහා වයස අවුරුදු 12 ට අඩු ළමුන් සහභාගි කරවීමට අවසර දෙනු නොලැබේ. වයස් සීමාව ගණනය කළ යුතු වන්නේ අදාල වසරේ දෙසැම්බර් 31 දිනට ය.

04. ක්‍රීඩා පුහුණුව සඳහා පාසල් සිසුන් විදේශගත කිරීමට අනුමැතිය ලබා නොදෙන අතර , මෙරටේ දී ලබා ගැනීමට නොහැකි විශේෂ පුහුණුවීම් සඳහා විදේශගත වීමට පහත සඳහන් කොන්දේසි යටතේ අවසර ලබා දෙනු ඇත.

1. අදාල ක්‍රීඩා පුහුණුව ලංකාවේ දී ලබා ගත නොහැකි බවට කරුණු සහිතව සනාථ කිරීම.

11. පුහුණු පාඨමාලාවේ අන්තර්ගතය හා අදාල කාල සටහන ද ඇතුළු තොරතුරු අධ්‍යාපන අමාත්‍යාංශයේ, අධ්‍යාපන අධ්‍යක්ෂ ( ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා ) වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීම.

05. ක්‍රීඩා කණ්ඩායම් වශයෙන් පිටරට යාමේ දී අදාල ක්‍රීඩාවේ අතිරේක ක්‍රීඩකයින් ද සමග කණ්ඩායමට නීත්‍යානුකූලව අයිති වන සංඛ්‍යාවට පමණක් අනුමැතිය දෙනු ලැබේ. මීට අමතරව නිලධාරීන් හා පුහුණුකරුවන්ට ද ආරාධනා පත්‍රය සැලකිල්ලට ගෙන අවසර ලබා දීමට කටයුතු කරනු ඇත.

06. විදේශ සංචාර සඳහා එක් අවස්ථාවක දී ක්‍රීඩක ක්‍රීඩිකාවන් උපරිමය 50 කට සීමා කර අනුමැතිය ලබා දෙනු ඇත.

විදේශ සංචාර හා ක්‍රීඩා තරගාවලි සංවිධානය කිරීමේ දී ඉහත කරුණු සැලකිල්ලට ගත යුතු බවද අවධාරණය කරමි. මීට අදාල චක්‍රලේඛවලින් දක්වා ඇති නීති රීති උල්ලංඝනය කරනු ලබන විදුහල්පතිවරුන්ට හා ගුරු භවතුන්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කරන බව ද දන්වමි.

ආරියරත්න හේවගේ,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.